# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

**2021 ජනවාරි**


**03 වෙළුම 01 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2021 වසරේ ජනවාරි මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 937ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 6.8කින් පහත වැටුණි.

2021 වසරේ ජනවාරි මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,592ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 8.3කින් පහත වැටුණි.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)





2021 වසරේ ජනවාරි මාසයේ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 6.8කින් පහළ ගිය අතර, ආනයන වියදම ද සියයට 8.3කින් පහළ ගියේය.

වෙළඳ හිඟය 2020 වසරේ ජනවාරි මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 730ට සාපේක්ෂව 2021 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 655ක් දක්වා අඩු විය.


## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2021 ජනවාරි)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන) / ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - ජනවාරි




### අපනයන පරිමා දර්ශකය - ජනවාරි





කාර්මික අපනයන පහත වැටීම හේතුවෙන් 2021 වසරේ ජනවාරි මාසයේ දී අපනයන ආදායම පහත වැටුණු අතර කෘෂිකාර්මික, ඛනිජමය හා වෙනත් අපනයන ආදායම ඉහළ ගියේය.


කාර්මික සහ කෘෂිකාර්මික අපනයන පරිමා පහළ යෑම හේතුවෙන් 2021 වසරේ ජනවාරි මාසයේ දී අපනයන පරිමා දර්ශකය පහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන

### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක





### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය

### ජනවාරි




### තේ සහ රබර් මිල ගණන් *




*කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වන අතර 2020 වසරේ අප්‍රේල් - අගෝස්තු කාලපරිච්ඡේදයේ රබර් වෙන්දේසි මිල ගණන් නොමැත.


2021 වසරේ ජනවාරි මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම ඉහළ ගිය අතර, කුළුබඩු (ප්‍රධාන වශයෙන් කුරුඳු) සහ තේ අපනයන ආදායම ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, මුහුදු ආහාර සහ පොල් අපනයන ආදායම පහත වැටුණි.

## කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජනවාරි)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2021 වසරේ ජනවාරි මාසයේ දී කාර්මික අපනයන ආදායම කැපී පෙනෙන ලෙස පහත වැටුණු අතර, රෙදිපිළි හා ඇඟලුම් සහ ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනවල පහළ ක්‍රියාකාරිත්වය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ රබර් නිෂ්පාදිත අපනයන ඉහළ ගියේය.

## ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජනවාරි)





### ආනයන පරිමා දර්ශකය (ජනවාරි)





2021 වසරේ ජනවාරි මාසයේ දී ආනයන වියදම පහත වැටුණු අතර, සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පහත වැටීම මේ සඳහා හේතු විය. මේ අතර, 2021 ජනවාරි මාසයේදී ආනයන පරිමා දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහත වැටුණු අතර, අන්තර් භාණ්ඩ හැර ආනයන යටතේ වර්ග කර ඇති අනෙකුත් සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පරිමා පහත වැටීම මේ සඳහා හේතු විය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජනවාරි)





සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්





2021 වසරේ ජනවාරි මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහළ ගියේය. මේ සඳහා පෞද්ගලික රථවාහන සහ රෙදිපිළි හා උපාංග වැනි ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු වුවද විදුලි සංදේශ මෙවලම් ආනයන ඉහළ ගියේය. මේ අතර, ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ ගිය අතර, සීනි සහ තෙල් හා මේද ආනයන වියදම ඉහළ යෑම මේ සඳහා හේතු විය.

# අන්තර් භාණ්ඩ ආනයන


අන්තර් භාණ්ඩ ආනයන වියදම





අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජනවාරි)





බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)





ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2021 වසරේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී ඉන්ධන, රසායනික නිෂ්පාදිත සහ මූල ලෝහ ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයනය


ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජනවාරි)




2021 වසරේ ජනවාරි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ වැටුණු අතර, මේ සඳහා සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම් පහත වැටීම හේතු විය.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | ජන. -දෙසැ. 2019 | ජන. - දෙසැ. 2020 | වෙනස (%) | ජන. - 20 | ජන. - 21 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **2,461.9** | **2,336.2** | **-5.1** | **188.7** | **199.9** | **5.9** |
| එයින් | තේ | 1,346.4 | 1,240.9 | -7.8 | 99.7 | 101.0 | 1.3 |
| | පොල් | 329.5 | 345.2 | 4.8 | 24.6 | 24.2 | -1.6 |
| | කුළුබඩු | 312.5 | 333.5 | 6.7 | 19.5 | 42.0 | 115.8 |
| | මුහුදු ආහාර | 262.5 | 189.8 | -27.7 | 23.7 | 16.9 | -28.5 |
| **කාර්මික අපනයන** | | **9,426.3** | **7,672.0** | **-18.6** | **812.6** | **732.3** | **-9.9** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 5,596.5 | 4,423.1 | -21.0 | 474.0 | 423.0 | -10.8 |
| | රබර් නිෂ්පාදිත | 866.1 | 786.1 | -9.2 | 70.2 | 80.2 | 14.3 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 521.1 | 373.6 | -28.3 | 82.8 | 34.4 | -58.5 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 447.0 | 464.0 | 3.8 | 35.5 | 39.7 | 12.0 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 400.0 | 337.5 | -15.6 | 30.5 | 41.1 | 34.8 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 305.7 | 181.5 | -40.6 | 24.7 | 23.4 | -5.4 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 102.9 | 53.9 | -47.6 | 5.6 | 3.5 | -37.2 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **51.8** | **39.2** | **-24.4** | **3.6** | **4.4** | **23.8** |
| **මුළු අපනයන** | | **11,940.0** | **10,047.4** | **-15.9** | **1,004.9** | **936.7** | **-6.8** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | ජන. -දෙසැ. 2019 | ජන. - දෙසැ. 2020 | වෙනස (%) | ජන. - 20 | ජන. - 21 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **3,956.5** | **3,401.7** | **-14.0** | **371.8** | **345.6** | **-7.0** |
| ආහාර හා පාන වර්ග | | 1,426.9 | 1,554.4 | 8.9 | 147.5 | 183.8 | 24.6 |
| එයින් | එළවළු (අ) | 310.0 | 352.9 | 13.8 | 35.9 | 40.5 | 12.7 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 2,529.6 | 1,847.3 | -27.0 | 224.2 | 161.8 | -27.9 |
| එයින් | පෞද්ගලික රථවාහන | 815.7 | 282.9 | -65.3 | 63.3 | 0.5 | -99.2 |
| **අන්තර් භාණ්ඩ** | | **11,369.6** | **9,076.5** | **-20.2** | **934.5** | **915.0** | **-2.1** |
| එයින් | ඉන්ධන | 3,891.6 | 2,542.6 | -34.7 | 291.9 | 309.8 | 6.2 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,909.4 | 2,335.1 | -19.7 | 300.8 | 236.5 | -21.4 |
| | පොහොර | 221.4 | 258.9 | 16.9 | 6.0 | 4.7 | -20.9 |
| | තිරිඟු හා ඉරිඟු | 346.4 | 384.4 | 11.0 | 8.9 | 6.9 | -22.9 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **4,610.9** | **3,577.2** | **-22.4** | **429.1** | **331.1** | **-22.8** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 2,489.7 | 2,176.1 | -12.6 | 258.7 | 216.6 | -16.2 |
| **මුළු ආනයන** | | **19,937.1** | **16,055.4** | **-19.5** | **1,735.3** | **1,591.6** | **-8.3** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | ජන. -දෙසැ. 2019 | ජන. - දෙසැ. 2020 | වෙනස (%) | ජන. - 20 | ජන. - 21 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -7,997.1 | -6,007.9 | | -730.4 | -654.9 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ආ)

| කාණ්ඩය | | ජන. -දෙසැ. 2019 | ජන. - දෙසැ. 2020 | වෙනස (%) | ජන. - 20 | ජන. - 21 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 138.5 | 116.5 | -15.9 | 139.9 | 130.4 | -6.8 |
| | පරිමා දර්ශකය | 147.2 | 132.9 | -9.7 | 150.1 | 135.5 | -9.7 |
| | මිල දර්ශකය | 94.1 | 87.7 | -6.8 | 93.2 | 96.2 | 3.3 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 148.7 | 119.7 | -19.5 | 155.3 | 142.4 | -8.3 |
| | පරිමා දර්ශකය | 164.2 | 145.5 | -11.4 | 173.1 | 165.8 | -4.2 |
| | මිල දර්ශකය | 90.5 | 82.3 | -9.1 | 89.7 | 85.9 | -4.3 |
| **වෙළඳ මිල අනුපාතය** | | 103.9 | 106.5 | 2.5 | 103.9 | 112.0 | 7.9 |

(අ) පරිප්පු, ළූණු,අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ආ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද